ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

**මහජන ආරක්ෂක අමාත්‍යාංශය**

**විශේෂ කාර්ය බලකාය**

(ශ්‍රී ලංකා පොලිසිය)

# ලංසු ආරාධනයයි (IFB)

# ගොඩනැගිලි ඉදිකිරීම්

01. සභාපති, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව, මහජන ආරක්ෂක අමාත්‍යාංශය, 18 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල විසින් පහත ඉදිකිරීම් සඳහා සුදුසුකම් සපුරා ඇති ලංසු කරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

| අනු අංකය | ව්‍යාපෘතිය | ව්‍යාපෘතියේ කාල පරිච්ඡේදය (දින) | ඇස්තමේන්තු ගත වැඩ වටිනාකම (රුපියල්) | ලංසු බැඳුම්කරයේ වටිනාකම (රුපියල්) | ICTAD හෝ CIDA ලියාපදිංචිය | ලංසු ලේඛන ගාස්තුව (රුපියල්) |
|---|---|---|---|---|---|---|
| 01 | විශේෂ කාර්ය බලකාය කටුකුරුන්ද පුහුණු පාසලේ කණිෂ්ඨ භෝජනාගාරය අළුත්වැඩියා කිරීම. **PS/03/PB/CON/08/06/24** | දින 182 | 38,000,000.00 | 570,000.00 | C-5 හෝ C-4 | 8,000.00 |

02. ලංසු කැඳවීම **ජාතික තරඟකාරී ලංසු ක්‍රමය** යටතේ සිදු කරනු ලබයි.

03. මේ පිළිබඳ උනන්දුවක් දක්වන සුදුසුකම් සපුරා ඇති ලංසුකරුවන්ට වැඩි විස්තර ප්‍රධාන ගණකාධිකාරී, මහජන ආරක්ෂක අමාත්‍යාංශය, 17 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල, වෙතින් ලබා ගැනීමටද, ප්‍රසිද්ධ හා බැංකු නිවාඩු දින හැර සතියේ දින වලදී **2024.11.22 දින සිට 2024.12.13** වන දින දක්වා **පෙ.ව 9.00 සිට ප.ව 3.00 අතර කාලයේදී මූල්‍ය අංශය, මහජන ආරක්ෂක අමාත්‍යාංශය, 17 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල හිදී** හෝ අපගේ නිල වෙබ් අඩවියෙන් **(www.pubsec.gov.lk)** ගාස්තු රහිතව ලංසු ලිපි ලේඛන පරීක්ෂා කළ හැකිය.

04. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතා සපුරණ ලද සියළුම ලංසු කරුවන්ට අදාල කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට නෛතික අයිතිය තිබිය යුතුය. ලංසුකරුවන් විසින් ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනයේ (ICTAD / CIDA) ඉහත දක්වා ඇති අදාළ කාණ්ඩය යටතේ හා 1987 අංක 03 දරණ ප්‍රසිද්ධ කොන්ත්‍රාත් පනත යටතේ (Public Contract Act) ලියාපදිංචි වී තිබිය යුතුය. ඉදිරිපත් කරනු ලබන ලංසුව සමග මෙම ලියාපදිංචි සහතික පිටපත් නොතිබීම ලංසුව ප්‍රතික්ෂේප වීමට හේතුවක් වේ. ලංසුකරුවන්ගේ නම අසාධු ලේඛණයේ ඇතුළත්ව නොතිබිය යුතුය. අමතර විස්තර ලංසු ලිපි ලේඛණ වල සපයා ඇත.

05. ප්‍රධාන ගණකාධිකාරී, මහජන ආරක්ෂක අමාත්‍යාංශය, 17 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල වෙත ලිඛිත ඉල්ලීමක් සහ ICTAD / CIDA ලියාපදිංචිය ඉදිරිපත් කර මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට ආපසු නොගෙවනු ලබන ඉහත වගුවේ සඳහන් ලංසු ගාස්තුව ගෙවීමෙන් **2024.11.22** වන දින සිට **2024.12.13 වන දින** දක්වා ප්‍රසිද්ධ හා බැංකු නිවාඩු දින හැර සතියේ දින වලදී **පෙ.ව 09.00 සිට ප.ව 03.00 දක්වා** කාලය තුල ඉංග්‍රීසි භාෂාවෙන් මුද්‍රිත ලංසු ලිපි ලේඛණ කට්ටලයක් ලබා ගත හැක. එක් ආයතනයක් වෙත එක් ව්‍යාපෘතියක් සඳහා එක් ලංසු පෝරමයක් පමණක් නිකුත් කරනු ලැබේ.

06. ලංසු පිටපත් දෙකක් සහිතව ලංසු විවෘත කරනු ලබන **2024.12.16 වන දින පෙ.ව 10.00 ට හෝ ඊට පෙර ප්‍රධාන ගණකාධිකාරී, මහජන ආරක්ෂක අමාත්‍යාංශය, 17 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල කාර්යාලයේ** තබා ඇති ලංසු බහාලනු ලබන ලංසු පෙට්ටියට බහාලීම හෝ ලංසු විවෘත කරන වේලාවට පෙර ලැබෙනසේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයේ වම්පස ඉහළ ලංසු අංකය පැහැදිලිව සටහන් කර තිබිය යුතුය. ප්‍රමාදවී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද පෞද්ගලිකව පැමිණ සිටීමට රිසි ලංසුකරුවන් හෝ ඔහුගේ නියෝජිතයින් ඉදිරිපිටදී **2024.12.16** වන දින මූල්‍ය අංශය, මහජන ආරක්ෂක අමාත්‍යාංශය, 17 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ලහිදී **පෙ.ව 10.00** ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කිරීම සඳහා සහභාගීවන ලංසුකරුවන්ගේ නියෝජිතයින් විසින් ලංසුකරුගේ ලිඛිත අවසරයක් අනිවාර්යෙන්ම රැගෙන ආ යුතුය. ලංසුකරුගේ ලිඛිත අවසරය ඉදිරිපත් කිරීමට අපොහොසත්වන කිසිදු නියෝජිතයෙකු ලංසු විවෘත කිරීම සඳහා සහභාගී කරනු නොලැබේ.

07. ඉදිරිපත් කරනු ලබන ලංසුවල වලංගු කාලය **2024.12.16 දින සිට 2025.03.17 දක්වා** විය යුතුය. (ලංසු විවෘත කරන දින සිට අවම වශයෙන් දින 91).

08. සියළුම ලංසු, **රුපියල් පන් ලක්ෂ හැත්තෑදහසක (රු.570,000.00) ඇපකරයක්** සමග ඉදිරිපත් කළ යුතු අතර, ඉදිරිපත් කරනු ලබන ලංසු ඇපකරය පහත කොන්දේසි යටතේ විය යුතුය.

    i. මහ බැංකුවේ අනුමත ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක වාණිජ බැංකුවක් වෙතින් ලබා ගන්නා ලද ඇපකරයක් හෝ ඉදිකිරීම් සඳහා සහතික කිරීමේ අරමුදල මගින් (CGF) ලබා ගන්නා ලද ඇපකරයක් විය යුතුය. ලංසු ඇපකරය ඉල්ලුමට ගෙවන සහ කොන්දේසි රහිත එකක් විය යුතුය.
    ii. ලංසු ඇපකර ආකෘති පත්‍රය ලංසු පෝරම කට්ටලයේ 09 වන කොටසේ ඇතුලත් පෝරමය පරිදි විය යුතුය.
    iii. ලංසු ඇපකරය ලේකම් / මහජන ආරක්ෂක අමාත්‍යාංශය **"Secretary / Ministry of Public Security"** නමින් විය යුතුය.
    iv. ලංසු ඇපකරයේ වලංගු කාලය **2024.12.16 දින සිට 2025.04.14** දින දක්වා විය යුතුය. (ලංසු විවෘත කල දින සිට අවම වශයෙන් දින 119).

09. **2024.12.03 වන දින පැය 11.00 ට** වැඩබිම වන විශේෂ කාර්ය බලකාය, පුහුණු පාසල, උපාලි සහබන්ධු මාවත, කටුකුරුන්ද, කළුතර ලිපිනයේ දී පූර්ව ලංසු රැස්වීමක් පැවැත්වේ. එයට ලංසුකරුවන්ගේ පැමිණීම අපේක්ෂා කෙරේ.

10. කලින් කලට වෙනස් වන මුදල් රෙගුලාසි සහ භාණ්ඩාගාරයේ උපදෙස් චක්‍රලේඛයන්ට අදාලව අවශ්‍ය සංශෝධනයන් එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළදී සිදු කිරීම ප්‍රසම්පාදන කමිටුව මගින් සිදු කළ හැකි අතර, ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය ලෙසට සැලකිය යුතුයි.

11. පහත සඳහන් ලිපිනය මගින් හෝ දුරකථන අංකය මගින් මේ සම්බන්ධව වැඩිදුර විමසීම් සිදු කළ හැක.

**ලිපිනය**

ප්‍රධාන ගණකාධිකාරී,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය
17 වන මහල, සුහුරුපාය,
බත්තරමුල්ල.

**දුරකථන අංක**

සෘජු දුරකථන අංකය - 011 - 2887697
පොදු දුරකථන අංක - 011 - 2886067
ෆැක්ස් අංකය - 011 - 2887784/2887916

**සභාපති,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**
**මහජන ආරක්ෂක අමාත්‍යාංශය,**
**18 වන මහල, සුහුරුපාය,**
**බත්තරමුල්ල.**